# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී

# ජනරජයේ ගැසට් පත්‍රය

## 2023 නොවැම්බර් මස 10 වැනි දින

## II වන කොටස

## අතිරේකය

## (2023.11.10 දින නිකුත් කරන ලදී)


# කල්බදු මූල්‍යකරණ (සංශෝධන)

2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත සංශෝධනය

කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.


මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

**මිල : රු. 09.00** **තැපැල් ගාස්තුව : රු. 50.00**

*මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 24 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ බදු දීමනාකරුවකුට කල් බද්ද යටතේ වූ ස්වකීය අයිතිවාසිකම් බදු ගැනුම්කරුගේ කැමැත්ත නොමැතිව යම් ලියාපදිංචි කරන ලද ආයතනයක් වෙත පැවරීමට හෝ භාර කිරීමට හැකියාව ලබාදීමට විධිවිධාන සැලැස්වීම වේ.

***3 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ බදු දීමනාකරුවකුට ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ වූ ස්වකීය අයිතිවාසිකම් බදු ගැනුම්කරුගේ බුන්වත් වීමක දී භාරකරුවකුට එරෙහිව හෝ බදු ගැනුම්කරුගේ ණයහිමියකුට එරෙහිව බලාත්මක කිරීමට නම් එම අයිතිවාසිකම් 2023 අංක දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ වලංගු ලෙස පරිපූර්ණත්වයට පත් කොට තිබිය යුතු බවට විධිවිධාන සැලැස්වීම වේ.

***4 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් කල්බදු මූල්‍යකරණයක් යටතේ වූ ස්වකීය අයිතිවාසිකම් 2023 අංක දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කර ඇති බදු දීමනාකරුවකුට උපකරණයක සන්තකය ආපසු ලබා ගැනීමේ අයිතිය තහවුරු කිරීමට විධිවිධාන සැලැස්වීම වේ.

**එල්.ඩී. - ඕ. 66/2017**

**2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** (1) මේ පනත 2023 අංක දරන කල්බදු මූල්‍යකරණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

(2) මේ වගන්තියේ විධිවිධාන හැර මේ පනතේ විධිවිධාන, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

**2.** (මේ පනතේ "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "කල්බදු මූල්‍යකරණයකට එළඹෙන අවස්ථාවකදී හෝ ඉන් පසුව ලබාගත් බදු දීමනාකරුගේ ලිඛිත කැමැත්ත ඇතිව, කල්බදු මූල්‍යකරණය යටතේ වූ" යන වචන වෙනුවට "බදු දීමනාකරුවකු විසින් කල්බදු මූල්‍යකරණය යටතේ වූ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

2000 අංක 56 දරන පනතේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "මේ පනත යටතේ බදු දීමනාකරුවකුගේ අයිතිවාසිකම්" යන වචන වෙනුවට "මේ පනත යටතේ වන බදු දීමනාකරුවකුගේ අයිතිවාසිකම්, ඒ බදු දීමනාකරු විසින් 2023 අංක දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ වලංගු ලෙස පරිපූර්ණ කර ඇත්නම්," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ "මේ පනත යටතේ හෝ කල්බදු මූල්‍යකරණයක විධිවිධානයක් යටතේ," යන වචන වෙනුවට "2023 අංක දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ හෝ තරගකාරී හිමිකම්පාන්නන් කිසිවකු නොමැති

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම

අවස්ථාවක දී කල්බදු මූල්‍යකරණයක විධිවිධානයක් යටතේ," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී